# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2025 ජුනි

### මානවශාස්ත්‍ර පීඨය

### නාට්‍ය හා රංගකලාව
(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)

### නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව DMAT – E3015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නූතන යුගය යනු කුමක්දැයි හඳුන්වා දී එහි ලක්ෂණ සමාලෝචනය කරන්න.

02. තත්කාලීන සමාජය පිළිබඳව සැලකිලිමත් වෙමින් නාට්‍ය ශානරයක් වශයෙන් රෝමාන්තිකවාදය (Romanticism) බිහිවීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

03. යථාර්ථවාදයේ (Realism) ලක්ෂණ මොනවාදැයි නාට්‍ය පිටපත් ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

04. නූතනවාදී නාට්‍යකරුවෙකු වශයෙන් හෙන්රික් ඉබ්සන්ගේ කාර්යභාරය ඇගයීමට ලක්කරන්න.

    **නැතහොත්**

    'බෝනික්කි ගෙදර (A Doll's House) නාට්‍යයේ නෝරා යනු නූතනවාදී ගැහැණියගේ ප්‍රතිමූර්තියයි,' යන මැයෙන් පුවත්පතකට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න.

05. පහත දැක්වෙන චරිත අතරින් 02 ක් තෝරාගෙන එම චරිතවල ස්වභාවය, ලක්ෂණ සහ පෞරුෂය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

    අ) රැනවෙස්කයා ආර්යාව
    ආ) ලොපකින්
    ඇ) පියර්ස්
    ඈ) ගයේෆ්

06. එපික් (Epic) නාට්‍ය කලාව නූතන නාට්‍ය ක්ෂේත්‍රයට සිදු කළ එකතු කිරීම් මොනවාදැයි පෙන්වා දෙන්න.

07. 'ගොඩෝ එනකං (Waiting for Godot) නාට්‍යයේ සාකච්ඡා කෙරෙන්නේ අතාර්කික ලෝකය තුළ අර්ථයක් සෙවීමට මිනිසුන් ගන්නා වෑයමයි.' උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

08. 'ආතර් මිලර්ගේ *All My Sons* නාට්‍යයේ ජෝ කෙලර් යනු ඇමරිකානු සිහින (American Dream) සංකල්පයේ ජීවමාන ප්‍රතිමූර්තියයි.' මෙම අදහස පිළිබඳ ඔබේ මතය හේතු සහිතව පැහැදිලි කරන්න.

09. ටෙනසි විලියම්ස්ගේ පුංචි පළිඟු රැන (The Glass Menagerie) නාට්‍යයේ තේමාව විවරණය කරන්න.

********************************